සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 6 - 2019

නම/විභාග අංකය :....................................... බුද්ධ ධර්මය කාලය: පැය 02යි.

සැලකිය යුතුයි :

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) සිදුහත් බෝසතාණෝ මව්කුස පිළිසිඳ ගත්තේ,

1. වෙසක් පෝ දිනක ය.
2. ඇසළ පෝ දිනක ය.
3. පොසොන් පෝ දිනක ය.
4. උඳුවප් පෝ දිනක ය.

(2) සුදොවුන් රජතුමා තම පුත් කුමරු හට පළමුවරට වැන්දේ,

1. නම් තැබීමේ උළෙලදා ය.
2. වප් මඟුල් උළෙලදා ය.
3. අසිත තාපස තුමාට කුමරු පෙන් වූ දා ය.
4. කුමරු ඉපදුනදා ය.

(3) යහපත් වචනය තෝරන්න.

1. සත්‍ය වචන කීම
2. කේළාම් කීම
3. පරුෂ වචන කීම
4. හිස් වචන කීම

(4) බිම්බිසාර රජතුමාට මල් සැපයුයේ

1. උදේනි මාලාකරු ය.
2. අසරණ ගොවියෙකු ය.
3. විශාඛා සිටු දියණිය ය.
4. සුමන මාලා කරුය.

(5) අපේ රටට බුදුදහම රැගෙන මිහිඳු හිමි වැඩම කරන විට මෙරට පාලනය කළ රජතුමා වූයේ,

1. සද්ධාතිස්ස රජතුමා ය.
2. දුටුගැමුණු රජතුමා ය.
3. දේවානම්පියතිස්ස රජතුමා ය.
4. ධර්මාශෝක රජතුමා ය.

**ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වල දැක්වෙන වගන්ති හරි නම් (3) ලකුණ ද වැරදි නම් (7) ලකුණ ද ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

(6) සිල්වත් වීමේ ආනිශංසයකි මරණින් පසු සුගතියෙහි ඉපදීම. ( )

(7) ශික්ෂාකාමී භික්ෂූන් අතර අගතනතුර ලැබුණේ රාහුල තෙරුන්ට ය. ( )

(8) අපේ මුල්ම පන්සල කාලපාසාද පිරිවෙනයි. ( )

(9) සම්මා ආජීව යනු යහපත් වචනයයි. ( )

(10) සුගන්ධං සීතලං කප්පං .... යන ගාථාව සුවඳදුම් පූජා කරන ගාථාවයි. ( )



LIVEWORKSHEETS

I  ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල (අ) කොටසේ වචන හා සම්බන්ධ වන (ආ) කොටසේ වචනය තෝරා ඉරකින් යා කරන්න.

| (අ) | (ආ) |
| --- | --- |
| (11) දියුණුවේ දොරටුවකි | යහපත් දිවි පැවැත්මයි. |
| (12) සම්මා ආජීව යනු | සංඝමිත්තා රහත් මෙහෙණියයි. |
| (13) ලක්දිව පැවිදි වූ මුල්ම කාන්තාව | දැහැමිව ජීවත් වීමයි. |
| (14) ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවූයේ | වෙනස්වීමයි. |
| (15) අනිත්‍යතාව යනු | අනුලා දේවිය. |

I  ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.

( සිඟාලෝවාද / චූල්ලරාහුලෝවාද / ජාතික ගීය / අත්තස්ස ද්වාර / නා ගස )

(16) රාහුල හිමි ........................................................................ සූත්‍රය අසා රහත් වූහ.

(17) දියුණුවේ රහස් පෙන්වා දුන්නේ ........................................................................ ජාතකයෙනි.

(18) මව්බිමෙහි සෞන්දර්යය හා සෞභාග්‍යය ........................................................................ මගින් පැවසෙයි.

(19) මංගල, සුමන යන බුදුරදුන් බුද්ධත්වයට පත්වූයේ ........................................................................ සෙවනේදී ය.

(20) මා - පිය, දූ - දරු යුතුකම් දක්වා ඇත්තේ ........................................................................ සූත්‍රයේ ය.

(ල. $2 \times 20 = 40$)



LIVEWORKSHEETS